මධ්‍යම පළාත් සභාවේ ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය.

1. සම්බන්ධ වන ආයතන.

1.1. දෙපාර්තමේන්තුව : මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව
යොමු අංකය : CPC/SD/03/02-(01) දිනය : 2020.11.23

1.2. අමාත්‍යාංශය : මධ්‍යම පළාත් ක්‍රීඩා විෂය භාර අමාත්‍යාංශය
යොමු අංකය :CPC/CMS/1/4/39 දිනය : 2020.12.19

1.3. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම:
යොමු අංකය :DMS/CP/0319 දිනය : 2018.06.28

1.4. මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය:
යොමු අංකය : CPC/CS/2/3/SOR/C10/2021 දිනය : 2021.02.11

1.5. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය :NSCC/10/71/5/19/SR දිනය : 2019.10.25

2. ක්‍රියාත්මක දිනය :මෙම පරිපාටිය මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරනු ලබන දින සිට ක්‍රියාත්මක වේ. එදින සිට මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 1998.05.28 දින අනුමත කරන ලද ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය හා මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් 2016.12.12 දින අනුමත කරන ලද මධ්‍යම පළාත් සභාවේ ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3 සේවා ගණයෙහි ක්‍රීඩා නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව ගන්නා ලද තීරණයන්ට අගතියක් නොවන පරිදි එම ව්‍යවස්ථාව සහ පරිපාටිය බල රහිත වේ.

3. පත් කිරීම් බලධරයා : මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයා විසින් බලය පවරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

4. සේවා ගණය පිළිබඳ විස්තර

4.1. සේවා ගණය : කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය - 2

4.2. ශ්‍රේණි : III, II සහ I ශ්‍රේණිය

4.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය : ආයතනයන්හි විධායක කළමනාකරණ හා පරිපාලන යන මට්ටම්වල නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා /හෝ පහසු කාරක කර්තව්‍යයන් අතුරින් විශේෂිත තාක්ෂණික නිපුණතාවයන්, එනම් තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතා (NVQ) මට්ටම හය (06) යටතට ගැනෙන්නාවූ ද පාඨමාලා කාලසීමාව මාස 13 හා 24 අතර වූ අදාළ තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා හිමි කර ගත යුතු නිපුණතා අවශ්‍ය වන කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත් කිරීම් බලධරයා විසින් සුවිශේෂී කොට දක්වනු ලබන කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

4.4. කාර්යයන් පැවරීම: ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2021.5.13 දින අනුමත කරන ලදී

5. තනතුරේ ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි.

පී.කේ.අබේරත්න
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
මධ්‍යම පළාත

6. වැටුප් :

6.1. වැටුප් කේත අංකය : MT 2 - 2016

6.2. වැටුප් පරිමාණය : රු. 30,140 - 10 × 350 - 11×370 - 10×560 - 10×660 - 49,910/-

6.3. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

6.3.1.

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| III | 01 | 30,140/- |
| II | 12 | 34,010/- |
| I | 23 | 38,270/- |

6.3.2. වැටුප් ගෙවීම හා අනෙකුත් කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධාන අනුව විය යුතුය.

6.3.3. තනතුරු නාමයන් හා සේවක සංඛ්‍යාවන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත පරිදි විය යුතුය.

7. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

7.1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණි | අනුමත තනතුරු සංඛ්‍යාව | තනතුරේ රාජකාරි හා වගකීම් |
|---|---|---|---|
| ක්‍රීඩා නිලධාරි | III, II , I | 36 | I. ප්‍රාදේශීය මට්ටමේ ක්‍රීඩා සමාජ ඇති කිරීම හා එම ක්‍රීඩා සමාජ වර්ෂය පුරා ක්‍රියාකාරීව පවත්වාගෙන යාමට අවශ්‍ය උපදෙස් ලබා දීම සහ ඒවා අධීක්ෂණය කිරීම. |
| | | | II. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පැවැත්වෙන ජාතික මහා ක්‍රීඩා උළෙලේ පළමු අදියරේ අන්තර් ක්‍රීඩා සමාජ තරඟාවලියේ කණ්ඩායම් තරඟ, කාන්තා හා පිරිමි ජවන හා පිටිය මලල ක්‍රීඩා තරඟ සංවිධානය කිරීම. මෙම තරඟ නියමිත ප්‍රමිතියෙන් යුක්තව තාක්ෂණික ක්‍රමවේදයන් අනුගමනය කරමින් ජාත්‍යන්තර නීතිරීතිවලට අනුකූලව පැවැත්වීමට කටයුතු කිරීම. |
| | | | III. අන්තර් ක්‍රීඩා සමාජ තරඟවලින් හඳුනාගත් කුසලතා පූර්ණ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා වර්ධනය කිරීම සඳහා සංචිතගත කර විශේෂ පුහුණු කඳවුරු පැවැත්වීම. |
| | | | IV. පොදු ජනතාවගේ විනෝදාස්වාදය සඳහා විවිධ ආයතන හා සංවිධාන අතර ක්‍රීඩා තරඟ පැවැත්වීම හා එම තරඟ සංවිධානය කිරීම. |
| | | | V. විවිධ සංස්කෘතික උත්සව අවස්ථාවන්ට (නිදහස් උත්සවය/අවුරුදු උත්සව/වෙනත් ආගමික හා සංස්කෘතික උත්සව) සමගාමීව ප්‍රදේශයේ උචිත ක්‍රීඩා වැඩසටහන් සංවිධානය කර පැවැත්වීම. |
| | | | VI. කොට්ඨාසයේ සංචිතගත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කණ්ඩායම් තරඟ හා මලල ක්‍රීඩා තරඟවලින් තෝරා ගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික මහා ක්‍රීඩා උළෙලේ දෙවන අදියර ලෙස පැවැත්වෙන දිස්ත්‍රික් අන්තර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තරඟ සඳහා යොමු කිරීම. |

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2021.5.13 දින අනුමත කරන ලදී

පී.කේ. අබේරත්න
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
මධ්‍යම පළාත

| | | | |
|---|---|---|---|
| | | | VII. ප්‍රදේශයේ ජනතාවගේ ශරීර සුවතාවය වර්ධනය කිරීම සඳහා වැඩසටහන් සැලසුම් කිරීම, සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම. |
| | | | VIII. ප්‍රදේශයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ක්‍රීඩා හැකියාවන් වර්ධනය කර ගැනීම සඳහා තාක්ෂණ මට්ටමේ උපදෙස් සපයමින් පුහුණු කටයුතු සිදු කිරීම සහ වෙනත් විවිධ තරඟ සඳහා යොමු කිරීම. |
| | | | IX. ප්‍රදේශයේ පොදු සංවර්ධන හා සුභසාධන කටයුතුවලදී ක්‍රීඩා සමාජවල දායකත්වය ලබා දීම සඳහා නායකත්වය සැපයීම. |
| | | | X. රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන, පුද්ගලයන් සම්බන්ධ කර ගනිමින් ක්‍රීඩා යටිතල පහසුකම් හා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අවශ්‍ය පහසුකම් ලබා දීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ගැනීම. |
| | | | XI. කාර්යාල ලිපි ගොණු හා දත්ත යාවත්කාලීනව පවත්වාගෙන යාම හා ගබඩා පාලනය. |
| | | | XII. කොට්ඨාසයේ ක්‍රීඩා සංවර්ධනය සඳහා වාර්ෂික ක්‍රීඩා සැලසුම් සකස් කිරීම හා ව්‍යාපෘති සැකසීම. |
| | | | XIII. ප්‍රදේශයේ ක්‍රීඩා ලෝලීන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා ක්‍රීඩාව පිළිබඳ දේශන, රූප මාධ්‍ය, ප්‍රවීණ පුහුණුකරුවන්, ක්‍රීඩකයින් ආශ්‍රිතව සිදු කරන වැඩසටහන් වලට ජනතාව යොමු කිරීම. |
| | | | XIV. පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ, ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි විසින් පවරන අමතර රාජකාරි වෙතොත් ඒවා ඉටු කිරීම. |

7.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 36 කි. ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යයන් සඳහා III, II සහ I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

8. බඳවා ගැනීමේ ක්‍රමය

8.1. බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | අදාළ නැත |
| කුසලතා | අදාළ නැත |

8.2. විවෘත බඳවා ගැනීම

8.2.1. බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2024.5.13 දින අනුමත කරන ලදී

ජී.කේ.අබේරත්න
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
මධ්‍යම පළාත

8.2.2. සුදුසුකම් :

8.2.2.1. අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම් :

(අ) I. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ සියලුම විෂයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබාගෙන තිබීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

සහ

III. ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ පළාත් මට්ටමින් (දිස්ත්‍රික් අතර) පැවැත්වෙන තරඟයන්හිදී එක හෝ දෙක ස්ථානයන් ලබා තිබීම, ජාතික මහා ක්‍රීඩා උළෙලේ එක, දෙක හෝ තුන ස්ථාන ලබා තිබීම, ක්‍රීඩා පනත යටතේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගම් මගින් පවත්වනු ලබන ජාතික ශූරතා තරඟවල එක, දෙක හෝ තුන ස්ථාන ලබා තිබීම.

හෝ

(ආ)

I. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

සහ

II. දකුණු ආසියාතික තරඟ, ආසියාතික තරඟ, පොදු රාජ්‍ය මණ්ඩලීය තරඟ, ඔලිම්පික් තරඟ හෝ ලෝක ශූරතා තරඟ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කර එක, දෙක හෝ තුන ස්ථාන සඳහා පදක්කම් ලබා තිබීම.

සංලක්ෂය:

ඉහත සඳහන් සුදුසුකම් යටතේ බඳවා ගන්නා නිලධාරීන් වසර 03 ක් ඇතුළත තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හය (06) මට්ටමේ වන්නා වූ ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික ඩිප්ලෝමාවක් ලබා ගැනීම සේවාව ස්ථිර කිරීම සඳහා අනිවාර්යය වේ. මෙම ජාතික වෘත්තීය කුසලතා (NVQ) හය (06) මට්ටමේ වන්නා වූ ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික ඩිප්ලෝමාවක් පළමු වසර තුන (03) තුළ ලබා නොගන්නා නිලධාරීන්ගේ සේවය පරිවාස කාලය අවසානයේදී ස්ථිර නොකරන අතර, ඔවුනගේ වැටුප් වර්ධක විලම්භනය කරනු ලැබේ.

එලෙස වැටුප් වර්ධක විලම්භනය කිරීමට භාජනය වූ නිලධාරියෙකු එසේ වැටුප් වර්ධක විලම්භනය කරන ලද දින සිට වසර දෙක (02) ක කාලයක් තුළ ජාතික වෘත්තීය කුසලතා (NVQ) හය (06) මට්ටමේ වන්නා වූ ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික ඩිප්ලෝමාවක් ලබා ගැනීමට අසමත් වන්නේ නම් ඔහුගේ පත්වීම මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් අකාර්යක්ෂමතාවය මත අවසන් කළ යුතු ය.

8.2.2.2. පළපුරුද්ද : අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සැලකේ.

8.2.2.3. කායික සුදුසුකම්: සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි කටයුතු ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. ශාරීරික යෝග්‍යතාවය පිරික්සීම සඳහා (පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව, ජාතික ක්‍රීඩා විද්‍යායතනය, ක්‍රීඩා වෛද්‍ය ඒකකය) විසින් පවත්වනු ලබන ශාරීරික යෝග්‍යතාව පිරික්සීමේ පරීක්ෂණයේදී ප්‍රතික්‍රියා වේගය, නම්‍යතාවය, උදරයේ ප්‍රතික්‍රියා වේගය, නම්‍යතාවය, උදරයේ ශක්තිය, දෙඅත්වල ශක්තිය, උලැගිතාවය, හිටි දුර පැනීම, වේගය හා දරා ගැනීමේ හැකියාව යන ශාරීරික යෝග්‍යතාවයන් පරීක්ෂාවට ලක් කෙරේ. (කායික හා මානසික ආබාධ තත්වයෙන් යුක්ත නොවිය යුතුය)

2021.5.13 දින අනුමත කරන ලදී

8.2.2.4. වෙනත් :

I. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. අයැදුම්කරු අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක කාලය තුළ මධ්‍යම පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

III. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුයි.

IV. යම් ආගමක හෝ ආගමික නිකායක පැවිදිවරයක් දරණ තැනැත්තෙක් නොවිය යුතුය.

V. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ සේවය ස්ථිර කර ඇති අය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සතුටුදායක සේවාවක් ඇති බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයකින් සනාථ කළ යුතුය.

VI. තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය 8.2.2. සිට 8.2.3 දක්වා සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

8.2.3. වයස

8.2.3.1. අවම සීමාව : අවු: 18 යි
8.2.3.2. උපරිම සීමාව : අවු: 35 යි

8.2.4. බඳවා ගැනීමේ ක්‍රමය :

8.2.4.1. ලිඛිත විභාගය : අදාල නොවේ.

8.2.4.2. වෘත්තීය පරීක්ෂණය: ශාරීරික යෝග්‍යතාවය පිරික්සීම සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයකින් සමන්විත විය යුතු ය. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය පහත සඳහන් අංශයන්ගෙන් සමන්විතය. ප්‍රතික්‍රියා වේගය, නම්‍යතාවය, උදරයේ ශක්තිය, දෙඅත්වල ශක්තිය, උලැඟිතාවය, හිට්දුර පැනීම, වේගය දරා ගැනීමේ ශක්තිය මැන බැලෙන පරීක්ෂණවලින් සමන්විතය.

8.2.4.3. යෝග්‍යතාවය ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණය:

| ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 10 | තෝරා ගැනීමට සලකා ලබනු ලබන අවම ලකුණු ප්‍රමාණය අදාල නොවන අතර, සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු ලබා ගන්නා අනුපිළිවෙළ අනුව වැඩිම ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ. |
| ක්‍රීඩා දක්ෂතාවයන් | 70 | |
| ක්‍රීඩා පුහුණු කිරීම, තරඟ විනිශ්චය/තරඟ සංවිධානය පිළිබඳ අතිරේක පළපුරුද්ද | 15 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | 05 | |
| එකතුව | 100 | |

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2021.5.13 දින අනුමත කරන ලදී

පී.කේ. අබේරත්න
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
මධ්‍යම පළාත

සුදුසුකම් සනාථ කරනු ලබන සහතික පරීක්ෂා කිරීම ද යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදීම සිදු කරනු ලබන අතර, යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ විස්තරාත්මක ලකුණු ලබාදීමේ ක්‍රමවේදය ඇමුණුම 01 හි අන්තර්ගත වේ.

සටහන :-

I. වෘත්තීය පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් පමණක් යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

II. ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත එක් එක් යෝග්‍යතාවය ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් අනුමත කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ඇත.

III. යෝග්‍යතාවය ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව අයදුම්කරුවන් මධ්‍යම පළාත් සභාවේ ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ කළමණාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ 2 සේවා ගණයෙහි (MT 2-2016) III ශ්‍රේණියේ ක්‍රීඩා නිලධාරී තනතුරට බඳවා ගනු ලැබේ.

8.2.4.4. යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

8.2.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ පුවත්පත්වල සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

8.3. සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ.
8.4. කුසලතා මත බඳවා ගැනීම : අදාළ නොවේ.

9. කාර්යක්ෂමතා කඩඉම්

9.1.

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය (ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත්) | විෂය නිර්දේශය |
|---|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට පත්වී වසර 03ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය. | ඇමුණුම 02 |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී/අන්තර්ග්‍රහණය වී වසර 03ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය. | ඇමුණුම 03 |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී/ අන්තර්ග්‍රහණය වී වසර 05ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය. | ඇමුණුම 04 |

ආණ්ඩුකාරතුමා විසින් 2021.5.13 දින අනුමත කරන ලදී.

9.2. කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද? : වසරකට වරක්.

9.3. කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින් .

පී.කේ.අබේරත්න
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
මධ්‍යම පළාත

10. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 අනුව සේවයට බැඳී වසර 03 ක් තුළ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

සටහන:රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හි විධිවිධාන ක්‍රියාත්මක වන දිනය වන 2007.07.01 දින සිට බඳවා ගත් නිලධාරීන් සඳහා අදාළ වේ.

11. ශ්‍රේණි උසස් කිරීම්

11.1. III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

11.1.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

11.1.1.1. **සපුරාලිය යුතු සුදුසුකම් :**

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. නිළධර ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක දහය (10) උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

11.1.1.2 **උසස් කිරීමේ ක්‍රමය :**

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිළධාරියා විසින් නියමිත ආකෘති පත්‍රය පරිදි (ඇමුණුම 05) ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම සිදුකරනු ලැබේ.

11.2. සේවා ගණයේ II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

11.2.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

11.2.1.1. සපුරාලිය යුතු සුදුසුකම්.

I. නිළධර ගණයේ II වන ශ්‍රේණියේ වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක දහය (10) උපයාගෙන තිබීම.

II. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

III. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

IV. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021.5.13 දින
අනුමත කරන ලදී.

ප.එස් අබේරත්න
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
මධ්‍යම පළාත

11.2.1.2. උසස් කිරීමේ ක්‍රමය: සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් (ඇමුණුම 05) හි සඳහන් නියමිත ආකෘති පත්‍රය අනුව පත් කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I වන ශ්‍රේණියට උසස් කිරීම සිදු කරනු ලැබේ.

12. තනතුරුවලට පත්කිරීම : අදාළ නොවේ .

13. නිර්වචනය

13.1. "පරිපාටිය" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ -2 සේවා ගණයෙහි ක්‍රීඩා නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියයි.

13.2. "ආණ්ඩුකාරතුමා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා වේ.

13.3. " කොමිෂන් සභාව" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

13.4. " ප්‍රධාන ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වේ.

13.5. "ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වේ.

13.6. "අමාත්‍යාංශ ලේකම්"යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ක්‍රීඩා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

13.7. "දෙපාර්තමේන්තු ප්‍රධානියා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වේ.

13.8. "පිළිගත් ආයතනය" යනුයෙන් අදහස් කරනුයේ, ජාතික ක්‍රීඩා විද්‍යායතනය හෝ ක්‍රීඩා විෂය භාර රේඛීය අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන දේශීය හෝ විදේශීය ක්‍රීඩා පිළිබඳ අධ්‍යාපන ආයතනයකි. මේ සම්බන්ධයෙන් තීරණය කිරීමේදී එම ආයතනයේ විෂය නිර්දේශය, කාලය හා දේශකයින්ගේ සුදුසුකම් පිළිබඳව රේඛීය අමාත්‍යාංශය විමසිලිමත් වනු ඇත. එමෙන්ම පාඨමාලාවේ සම්පූර්ණ කාලයෙන් 50% කට වැඩි ප්‍රතිශතයක් අදාළ ක්‍රීඩා විෂය ආවරණය විය යුතුය.

13.9. "සතුටුදායක සේවා කාලය" යනුවෙන් අදහස් කරනුයේ,

රජයේ නිලධරයකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මගින්ද, සමත්විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම සමත්වීම මගින්ද, සිදුකළ යුතුව තිබූ පත්වීම් ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද , එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේය.

13.10. " සක්‍රිය සේවා කාලය " යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාලපරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2021.5.13 දින අනුමත කරන ලදී

පී.කේ.අබේරත්න
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
මධ්‍යම පළාත

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම:

මෙම බඳවාගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට, සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 මගින් ලබා දී ඇති වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියලු දෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ තනතුරට පත් කරන ලද දිනය පදනම් කරගෙනය. කෙසේ වතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

i. දැනට MT 1-2016 වැටුප් පරිමාණයෙහි III ශ්‍රේණිය යටතේ වැටුප් ලබන ක්‍රීඩා නිලධාරීන් පිළිවෙලින් ප්‍රතිසංවිධිත MT 2 - 2016 වැටුප් පරිමාණයේ III ශ්‍රේණියටද,

ii. දැනට MT 1 -2016 වැටුප් පරිමාණයෙහි II ශ්‍රේණිය යටතේ වැටුප් ලබන ක්‍රීඩා නිලධාරීන් පිළිවෙලින් ප්‍රතිසංවිධිත MT 2 - 2016 වැටුප් පරිමාණයේ II ශ්‍රේණියටද,

iii. දැනට MT 1 -2016 වැටුප් පරිමාණයෙහි I ශ්‍රේණිය යටතේ වැටුප් ලබන ක්‍රීඩා නිලධාරීන් පිළිවෙලින් ප්‍රතිසංවිධිත MT 2 - 2016 වැටුප් පරිමාණයේ I ශ්‍රේණියටද,

අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

15. අන්තර්කාලීන විධිවිධාන.

15.1. අන්තර්ග්‍රහණ ක්‍රියාවලිය යටතේ මෙම සේවයට අන්තර්ග්‍රහණය වන නිලධාරීන් සඳහා නව පරිපාටියේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් සහ අනෙකුත් අවශ්‍යතා සපුරා ගත යුතුය. කෙසේ වෙතත් අන්තර්ග්‍රහණයට පෙර එම නිලධාරීන් සඳහා පෙර පැවති අනුමත සේවා ව්‍යවස්ථාවේ සඳහන් නියමිත ශ්‍රේණියෙහි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් /පරීක්ෂණ වලින් සමත්ව හෝ නිදහස්ව ඇත්නම් මෙම ව්‍යවස්ථාවේ සඳහන් අදාළ කාර්යක්ෂමතා කඩඉමෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

15.2. මෙම නව පරිපාටියට අනුව අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන්ගේ අදාල ශ්‍රේණියේ සේවා කාලය, පෙර අනුමත සේවා ව්‍යවස්ථාවට අනුව ඔවුන් සිටි පන්තියේ /ශ්‍රේණියේ සේවා කාලය ලෙස සලකනු ලැබේ.

16. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, මධ්‍යම පළාත් සභා මූල්‍ය රීති සහ රජය/මධ්‍යම පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීතිරීති හා/හෝ රෙගුලාසි අදාල වේ.

17. මෙම බඳවාගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි තීරණය කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021.5.13 දින
අනුමත කරන ලදී

පී.කේ.අබේරත්න
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
මධ්‍යම පළාත

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය:- නිර්දේශ කරමු.

| | | | |
|---|---|---|---|
| 01. | පී.ජී. අමරකෝන් මහතා | (සභාපති) | ........................ |
| 02. | ඩබ්ලිව්.එම්.එස්.ඩී. වීරකෝන් මහතා | (සාමාජික) | ........................ |
| 03. | ඒ.එම්.ආර්.බී. තෙන්නකෝන් මහතා | (සාමාජික) | ........................ |
| 04. | ඒ.එම්. වයිස් මහතා | (සාමාජික) | ........................ |
| 05. | එච්.එම්.ඩී.ආර්. හේරත් මහතා | (සාමාජික) | ........................ |
| 06. | ජේ.ඩී.කේ.වික්‍රමරත්න මහතා | (සාමාජික) | ........................ |
| 07. | ඩබ්.එම්.කේ.කේ.කරුණාරත්න මිය | (සාමාජික) | ........................ |

දිනය 2021.04.20

ආණ්ඩුකාර ලේකම්,

2021.04.20 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 2021/615 යටතේ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 02 සේවා ගණයෙහි ක්‍රීඩා නිලධාරි තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2021.05.06

........................................
ලේකම්
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නිල මුද්‍රාව පී.ඒ.ඩබ්ලිව්. දයානන්ද
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

අනුමත කරමි/නොකරමි

........................................ ගමගේ
මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා
ආණ්ඩුකාර
මධ්‍යම පළාත

දිනය 2021-05-13

ඇමුණුම 01

01. විභාගයේ නම:- මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ III වන ශ්‍රේණියේ ක්‍රීඩා නිලධාරි තනතුරට බඳවා ගැනීමේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය.

02. ලකුණු දීමේ පරිපාටිය.

| ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | | ලබා දෙන ලකුණු | සමස්ත ලකුණු |
|---|---|---|---|
| 01. ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ අධ්‍යාපනික සුදුසුකම් | | | 10 |
| I. රජයේ පිළිගත් ආයතනයක් මගින් නිකුත් කරන ක්‍රීඩා උපාධිය ලබා තිබීම. | | 5 | |
| II. ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ සය මාසික උසස් පුහුණුකරු පාඨමාලාව සමත්වීම. | | 3 | |
| III. මාස 09 කට නොඅඩු ක්‍රීඩා ඩිප්ලෝමාවක් ලබා තිබීම. | | 2 | |
| 02. ක්‍රීඩා දක්ෂතාවයන් | | | 70 |
| I. ඔලිම්පික් තරඟ | සහභාගීත්වය | 70 | |
| II.පොදු රාජ්‍ය මණ්ඩලීය තරඟ | 1 වන ස්ථානය | 56 | |
| | 2 වන ස්ථානය | 52.5 | |
| | 3 වන ස්ථානය | 49 | |
| III. ලෝක ශූරතා තරඟ | 1 වන ස්ථානය | 56 | |
| | 2 වන ස්ථානය | 52.5 | |
| | 3 වන ස්ථානය | 49 | |
| IV. ආසියාතික ක්‍රීඩා උළෙල | සහභාගීත්වය | 42 | |
| | 1 වන ස්ථානය | 56 | |
| | 2 වන ස්ථානය | 52.5 | |
| | 3 වන ස්ථානය | 49 | |
| V.පොදු රාජ්‍ය මණ්ඩලීය ශූරතා තරඟ | 1 වන ස්ථානය | 52.5 | |
| | 2 වන ස්ථානය | 49 | |
| | 3 වන ස්ථානය | 45.5 | |
| VI.ආසියානු ශූරතා තරඟ | 1 වන ස්ථානය | 49 | |
| | 2 වන ස්ථානය | 45.5 | |
| | 3 වන ස්ථානය | 42 | |
| VII.දකුණු ආසියානු ක්‍රීඩා උළෙල | 1 වන ස්ථානය | 49 | |
| | 2 වන ස්ථානය | 45.5 | |
| | 3 වන ස්ථානය | 42 | |
| VIII.දකුණු ආසියානු ශූරතා තරඟ | 1 වන ස්ථානය | 45.5 | |
| | 2 වන ස්ථානය | 42 | |
| | 3 වන ස්ථානය | 38.5 | |
| IX.ජාතික මහා ක්‍රීඩා උළෙල | 1 වන ස්ථානය | 35 | |
| | 2 වන ස්ථානය | 31.5 | |
| | 3 වන ස්ථානය | 28 | |
| X.පිළිගත් ජාතික ක්‍රීඩා සංගම් විසින් පවත්වනු ලබන ජාතික ශූරතා තරඟ | 1 වන ස්ථානය | 35 | |
| | 2 වන ස්ථානය | 31.5 | |
| | 3 වන ස්ථානය | 28 | |
| XI. ජාතික මහා ක්‍රීඩා උළෙල තෙවන අදියරේ පළාත් තරඟ | 1 වන ස්ථානය | 10.5 | |
| | 2 වන ස්ථානය | 7 | |
| | 3 වන ස්ථානය | 3.5 | |

... විසින් 2021.5.13 දින අනුමත කරන ලදී

පී.කේ.අබේරත්න
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
මධ්‍යම පළාත

| | | |
|---|---|---|
| 03. ක්‍රීඩා පුහුණු කිරීම,තරඟ විනිශ්චය/තරඟ සංවිධානය පිළිබඳ අතිරේක පළපුරුද්ද<br><br>I. ජාත්‍යන්තර ක්‍රීඩා සංගම් මගින් නිකුත් කරන පුහුණුකරු බලපත්‍ර ලබා තිබීම.<br>II. ජාතික මට්ටමේ හෝ ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කර තිබීම.<br><br>III. ජාතික මට්ටමේ හෝ ජාත්‍යන්තර මට්ටමේ තරඟ විනිශ්චයකරුවෙකු/තරඟ සංවිධායකයෙකු ලෙස කටයුතු කිරීම. | <br><br>5<br><br>5<br><br>5 | 15 |
| 04. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා | 5 | 5 |
| මුළු ලකුණු | 100 | |

සැලකිය යුතුයි:-

ඉහත අංක (02) හි ක්‍රීඩා දක්ෂතාවයන් යටතේ ලකුණු ලබාදීමේදී පහත සහන් කොන්දේසි අනුගමනය කළ යුතුය.

- අදාළ ජාත්‍යන්තර තරඟ පිළිගත් ජාත්‍යන්තර ක්‍රීඩා සංගම් විසින් සංවිධානය කරනු ලබන තරඟාවලීන් විය යුතුය.
- අයදුම්කරු විසින් දක්වා ඇති ඉහළම දක්ෂතාවයට පමණක් ලකුණු ලබාදීම සිදු කළ යුතුයි. යම්කිසි අවස්ථාවකදී අයදුම්කරුවන් කිහිප දෙනෙකු අතර ලකුණු සමවීමක් සිදු වූ විටකදී අයදුම්කරුවන් විසින් සපුරා ඇති ඉහළම දෙවන දක්ෂතාවයන් පිළිබඳ සළකා බලා ප්‍රමුඛතාවය තීරණය කළ යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021.5.13 දින
අනුමත කරන ලදී.

පී.කේ.අබේරත්න
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී

ඇමුණුම 02

01. විභාගයේ නම:- මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ III වන ශ්‍රේණියේ ක්‍රීඩා නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

02. විභාගය/වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තරය:

| ප්‍රශ්න පත්‍රය | | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 01. | ආයතන සංග්‍රහය සහ මධ්‍යම පළාත් සභා මූල්‍ය රීති පිළිබඳ මූලික දැනුම. | පැය 01 යි | 100 යි | 40% |
| 02. | ක්‍රීඩා පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම. | පැය 01 යි | 100 යි | 40% |

මෙම ප්‍රශ්න පත්‍ර 02 කෙටි හා/හෝ බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වේ.

03. විභාගය පවත්වනු ලබන බලධරයා:මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්.

04. විභාගය පවත්වනු ලබන කාලසීමාව: වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01.ආයතන සංග්‍රහය සහ මධ්‍යම පළාත් සභා මූල්‍ය රීති පිළිබඳ මූලික දැනුම | i. ආයතන සංග්‍රහයේ VII, XII,XIV,XVII,XXIV පරිච්ඡේද<br>ii. මධ්‍යම පළාත් සභා මූල්‍ය රීති පිළිබඳ මූලික දැනුම |
| 02. ක්‍රීඩා පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම | ක්‍රීඩා පිළිබඳ නීති රීති හා ක්‍රීඩා පනත පිළිබඳ දැනුම හා ක්‍රීඩා තාක්ෂණික ක්‍රමවේද පිළිබඳ දැනුම පරීක්ෂාව |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021.5.13 දින
අනුමත කරන ලදී.

පී.කේ. අබේරත්න
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
මධ්‍යම පළාත

ඇමුණුම 03

01 විභාගයේ නම: මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ II වන ශ්‍රේණියේ ක්‍රීඩා නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

02 විභාගය පිළිබඳ විස්තර (II ශ්‍රේණියට පත් වී වසර 03 ක් ගත වීමට පෙර) :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01. පරිගණක පරීක්ෂණය | පැය 01 යි | 100 | 40% |
| 02. විනිසුරු බලපත්‍ර 02 ක් ලබා තිබිය යුතුයි. | | | |

03 විභාගය පවත්වනු ලබන බලධරයා: මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

04 විභාගය පවත්වනු ලබන කාලසීමාව: වසරකට දෙවරක්.

05 විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 03. පරිගණක පරීක්ෂණය | i. මයික්‍රෝ සොෆ්ට් ඔෆිස්<br>ii. මයික්‍රෝ සොෆ්ට් වර්ඩ්<br>iii. මයික්‍රෝ සොෆ්ට් එක්සෙල්<br>iv. මයික්‍රෝ සොෆ්ට් පවර් පොයින්ට් ( මෘදුකාංගය මෙහෙයවීම)<br>v. අන්තර්ජාලය භාවිතය පිළිබඳ මූලික දැනුම. |
| 04. විනිසුරු බලපත්‍ර | අදාළ සංගමය විසින් ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පවත්වා නිකුත් කර තිබිය යුතුයි. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021.5.13 දින
අනුමත කරන ලදී

පී.කේ.අබේරත්න
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
මධ්‍යම පළාත

ඇමුණුම 04

1. විභාගයේ නම: මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ I වන ශ්‍රේණියේ ක්‍රීඩා නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

2. විභාගය පිළිබඳ විස්තරය (I ශ්‍රේණියට පත් වී වසර 05 ක් ගත වීමට පෙර):

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01.මුදල් රෙගුලාසි පිළිබඳ මූලික දැනුම | පැය 01 යි | 100 යි | 40% |
| 02.පුහුණු න්‍යායන් පිළිබඳ සාමාන්‍ය දැනුම | පැය 01 යි | 100 යි | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා: මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්.

4. විභාගය පවත්වනු ලබන කාලසීමාව: වසරකට දෙවරක්.

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01.මුදල් රෙගුලාසි පිළිබඳ මූලික දැනුම | මුදල් රෙගුලාසි IV, V, VI, IX යන පරිච්ඡේද |
| 02.පුහුණු න්‍යායන් පිළිබඳ සාමාන්‍ය දැනුම | පුහුණු මූලධර්ම, පුහුණු ක්‍රම පිළිබඳ දැනුම |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021.5.13 දින
අනුමත කරන ලදී

පී කේ අබේරත්න
... නිලධාරී

ඇමුණුම 05

<u>ශ්‍රේණි උසස්වීම් ලබා ගැනීම සඳහා වූ අයදුම්පත්‍රය</u>

1. නිලධාරියා පිළිබඳ තොරතුරු
   - 1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම : - .............................................................................
   - 1.2 හැඳුනුම්පත් අංකය : - .......................................................................................
   - 1.3 සේවා ස්ථානය හා එහි ලිපිනය : -..........................................................................
   - 1.4 තනතුර :-...........................................................................................................
   - 1.5 අයත්වන සේවා ගණය හා ශ්‍රේණිය : -......................................................................

2. පත්වීම පිළිබඳ තොරතුරු

   2.1 පත්වීම් දිනය : -..........................................

   2.2 පත්වීම ස්ථිර කල දිනය : -..........................................

   2.3 සමත් වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය : -..........................................

| සමත් වූ කාර්යක්ෂමතා කඩඉම | සමත් විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

   2.4 සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම හා සමත් දිනය : -

| සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත් විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

3. උසස් වීමට අදාළ තොරතුරු

   3.1 උසස් වීමට අපේක්ෂිත ශ්‍රේණිය : - II / I

   3.2 උසස් වීමට අපේක්ෂිත ධාරාව : - සාමාන්‍ය

   - 3.2.1 අවශ්‍ය සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කර තිබේද? ඔව් / නැත
   - 3.2.2 සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කළ දිනය : -
   - 3.2.3 අපේක්ෂිත සක්‍රීය සේවා කාලය තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමේ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබේද? ඔව් / නැත
   - 3.2.4 නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේද? ඔව් / නැත
   - 3.2.5 උසස් වීමට පූර්වාසන්න පස් වසර තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද? ඔව් / නැත
   - 3.2.6 විනය දඬුවම් ලබා තිබේද? ඔව් / නැත

4. අයදුම්කරුගේ ප්‍රකාශය

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත් ............................ දින සිට සාමාන්‍ය කාර්ය සාධනය යටතේ II / I ශ්‍රේණියට උසස්වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය:........................................ අත්සන............................................

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021.5.13 දින
අනුමත කරන ලදී
ජී.කේ.අබේරත්න
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය

5. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඉහත නම සඳහන් ..........................................................................................................මහතා/මහත්මිය/මෙය ......................................................................... සේවා ශ්‍රේණියේ .................. ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියළු කරුණු සම්පූර්ණ කර ඇති බවටත් සෑහීමට පත් වෙමි. ඒ අනුව එම නිලධාරියා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

නම :-.................................
අත්සන :-.................................
දිනය :-.................................

නිල මුද්‍රාව :-.................................

6. අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉහතින් දක්වා ඇති කරුණු නිවැරදි බවත් / නිවැරදි නොවන බවත් ඒ අනුව ඉහත නිර්දේශ හා එකඟ වන බවත් / එකඟ නොවන බවත් කාරුණිකව දන්වමි.

නම :-.................................
අත්සන :-.................................
දිනය :-.................................

නිල මුද්‍රාව :-.................................

7. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ නිර්දේශය

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඒ අනුව ..................................................... මහතා/මහත්මිය/මෙය ............................................. සේවා ශ්‍රේණියේ ............. ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය යටතේ ..................... දින සිට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

නම :-.................................
අත්සන :-.................................
දිනය :-.................................

නිල මුද්‍රාව :-.................................

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024 . 5 . 13 දින
අනුමත කරන ලදී

පී.කේ.අබේරත්න
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
මධ්‍යම පළාත

ඇමුණුම 06

<u>මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියට අනුව අන්තර්ග්‍රහණය කිරීම.</u>

I කොටස - අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුයි.

1. ස්ථානය සහ ලිපිනය : ......................................................................................................................................................
...........................................................................................................................................

2. අයදුම්කරුගේ සම්පූර්ණ නම : ...........................................................................................................
.................................................................................................................මෙය/මහත්මිය/මහතා

3. (i) උපන්දිනය : ..................................... (ii) පරිපාටිය ක්‍රියාත්මක වන දිනට වයස :...........................

4. දැනට දරන තනතුර : .................................................

5. පත්වීමේ ස්වභාවය : ......................................

5.1 තනතුරට අදාළ මුල් පත්වීමේ දිනය හා ලිපියේ අංකය : ...................................................................
5.2 පත්වීම ස්ථිර කළ දිනය හා ලිපියේ අංකය : ......................................................................................

6. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 9/2004 අනුව,

1. වැටුප් පරිමාණය : ............................................................................................
2. වැටුප් කේත අංකය : ......................................

7. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව,

1. වැටුප් පරිමාණය : .........................................................................................................
2. වැටුප් කේත අංකය: ...........................................
3. 2011.07.31 වැනි දිනට
   (අ) වැටුප් තලය : රු ................................
   (ආ) වැටුප් පියවර අංකය : .......................................

8. දැනට සිටින තනතුරට බඳවාගැනීමේ පටිපාටිය අනුව දැනට දරන තනතුරට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් :
..........................................................................................................................................

9. රාජකාරී විස්තරය (සැකෙවින්) : ...............................................................................................
........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................

10. දැනට සිටින තනතුරට බඳවා ගනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටිය අනුව නියම කර ඇති කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් වූ දිනයන් :

| <u>කාර්යක්ෂමතා කඩඉම් විභාගය</u> | <u>සමත් වූ දිනය</u> |
|---|---|
| 1. ........................................................ | ........................ |
| 2. ........................................................ | ........................ |
| 3. ........................................................ | ........................ |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2021. 5. 13 දින
අනුමත කරන ලදී.

ජී.කේ.අබේරත්න
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
මධ්‍යම පළාත

11. සේවා කාලය පිළිබඳ විස්තරය (අවශ්‍ය වේ නම් ඇමුණුමක් භාවිතා කරන්න)

| සේවා කාලය | | තනතුර | ස්ථානය | කාලය (අවුරුදු) |
|---|---|---|---|---|
| සිට | දක්වා | | | |
| | | | | |
| | | | | |
| | | | | |

12. ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

දිනය : .............................   ...................................
අයදුම්කරුගේ අත්සන

2 කොටස - ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුයි.

අයදුම්කරු විසින් 1 සිට 11 දක්වා සඳහන් කර ඇති තොරතුරු නිවැරදි අතර (අදාළ වේ නම් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් වැටුප සඳහා නිර්දේශ ලබා දුන් ලිපියේ පිටපතක්ද ඉදිරිපත් කරමි) ඔහු/ඇය මෙම සේවයට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි./ නොකරමි. (නිර්දේශ නොකරන්නේ නම් හේතු සඳහන් කළ යුතුයි.)

දිනය................................

...................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන හා
නිල මුද්‍රාව.

3. කොටස - අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය:-

දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉහතින් දක්වා ඇති කරුණු නිවැරදි බවත්/නිවැරදි නොවන බවත්, ඒ අනුව ඉහත නිර්දේශ හා එකඟ වන බවත්/එකඟ නොවන බවත් කාරුණිකව දන්වමි.

දිනය................................

...................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන හා
නිල මුද්‍රාව.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ප්‍රයෝජනය සඳහා.

4. කොටස - රාජ්‍ය සේවා කොමිෂන් සභාවේලේකම්ගේ නිර්දේශය:-

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඒ අනුව ................................................... මහතා/මහත්මිය/මෙය...................................................සේවා ශ්‍රේණියේ .......................ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය යටතේ.................දින සිට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2021.5.13 දින අනුමත කරන ලදී

දිනය................................   ...................................................
බලය පැවරුණු නිලධාරියාගේ
අත්සන.
(නිලමුද්‍රාව)

ජී.කේ. අබේරත්න
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
මධ්‍යම පළාත